# X ව්‍යාපාරයේ ඉතිහාසය තුළින්

# නවක ඔබ පිළිගැනීම...

අපගේ අත්දැකීම් අනුව, අප දේශපාලන ව්‍යාපාරයට පැමිණෙන කණ්ඩායම් වර්ග කිහිපයක් හඳුනාගත හැකිය.

01. කිසිදු සමාජ-දේශපාලන ව්‍යාපාරයක් සමඟ සම්බන්ධ නොවුනු දේශපාලන ව්‍යාපාර සමඟ කටයුතු කිරීමට නුපුරුදු පිරිස.

02.අප සංවිධානය සමඟ සෘජුව සම්බන්ධ වූවන් හා පැරණි සමාජික-සමාජිකාවන් හා කටයුතු කර ඇති පිරිස.

03. සංවිධානය හා සෘජු සම්බන්ධයක් නොමැති වුවද ‘මාතොට’ සඟරාවේ සිට අප සංවාදය දුරස්ථව සිට අඛණ්ඩව පරිහරණය කරන පිරිස

04.ජ.වි.පෙ සහ පෙ.ස.පෙ වෘත්තීය සමිති සමඟ සෘජුව සම්බන්ධ වී ක්‍රියාකර ඉන් ඉවත්වුණු පිරිස. එම කණ්ඩායම් වර්ග වේ.

ඉහත පළමු කාණ්ඩය තුළ සිටින බහුතර තරුණ තරුණියන් යනු, අපගේ සමාජ ව්‍යාපාරයේ වයස හා සමාන වයස් කාණ්ඩයන් නියෝජනය කරන්නෝය. එනම් වයස අවුරුදු 25 හෝ ඊට අඩු පිරිසයි. ඔවුන් බොහෝ විට අප දේශපාලනයට ආශක්ත වන්නේ අපගේ සමාජ ව්‍යාපාරයේ නායක X කණ්ඩායමේ නිර්මාතෘ දීප්ති කුමාර ගුණරත්නගේ වීඩියෝ, ලිපි ලේඛන සහ විවිධ ස්ථානයන්හි ඔහු ගේ දේශන සඳහා සහභාගීවීමෙන් ලත් දැනුම තුළිනි. එම නවකයින් ගේ දැනුම උදෙසා අප ව්‍යාපෘරයේ නිර්මාතෘ පිළිබඳව සහ අප ව්‍යාපාරය සමාජයීයව ලත් අත්දැකීම් මෙන්ම අපගේ අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳව ඉතා කෙටි සාරාංශයක් ඉදිරිපත් කිරීම මෙහි අරමුණවේ.

දීප්ති දේශපාලනයට පිවිසීමට ප්‍රථමයෙන් කලා ක්ෂේත්‍රය තුළ වේදිකා නාට්‍ය, සිනමාව සහ පරිසරය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් උනන්දුවෙන් සිය අධ්‍යනයක් සිදු කළේ 80 දශකයේ දීය. එම 80 දශකය යනු, 80 වැඩ වර්ජනයත්, 83 ජූලි මස LTTE යුද්ධය ආරම්භවීමත්, තරුණ තරුණියන් 60, 000 ක් මරණයට පත්කළ 88-89 වකවානුවෙහි පැවැති භීෂණයත්, සිද්ධීන් විසින් ලාංකීය සමාජය කම්පනයට පත් කරන ලද දශකයක් විය. ඒ වන විට පැවැති සියලුම වාමාංශික සහ දක්ෂිණාංශික දේශපාලන කණ්ඩායම්

ආයුධ සන්නද්ධ වෙත්දි දීප්ති විසින් ආරම්භ කරන ලද්දේ හැදෑරීමයි. රට තුළ සිදුවෙමින් පැවැති තත්වය මත හැදෑරීමට යොමු වීම යනුම නව ක්‍රියාවක් විය. ඒ සඳහා ඔහු විසින් ජර්මන් සංස්කෘතික මධ්‍යස්ථානය සහ බ්‍රිතාන්‍ය කවුන්සිල පුස්ථකාලය පාවිච්චි කරන ලදී.

එම හැදෑරීම්වලට සමාන්තරව දීප්ති විසින් 1989 වර්ෂයේදී 'යාත්‍රා' නමින් පුවත්පතක් ඇරඹීමත්, 'රශ්මිය', 'හිරු' සහ 1993 'ප්‍රවාද' සඟරාවට සම්බන්ධවී එයට තම අදහස් ලිවීමත්, සිවිල් චින්තකයින් සම්බන්ධව විවේචන ගෙන ඒමත්, 'විභවි' වැනි ආයතනයක් සමඟ කෙටිකලක් කටයුතු කිරීමට උත්සාහ කිරීමත් සිදුවිය. එම අවධියේදී එකළ ප්‍රධානතම සිවිල් චින්තකයා වූ මහචාර්ය සුචරිත ගම්ලත් වැනි මාක්ස්වාදී චින්තකයින්ගේ අදහස් සඳහා සෘජුවම ගෙනා විවේචන තුළ දීප්තිගේ මතවාද කැපී පෙනුනි. මන්ද ඒ වන විට **'ලාංකීය මතවාදී උපරිව්‍යුහය'** තුළ නියෝජනය කළේ මහචාර්යය ගම්ලත් වැනි සිවිල් චින්තකයින්ගේ කතිකාව වන අතර, ඒ තුළ අධිපති මතවාදයන් නියෝජනය කළ චින්තකයින් වූයේ කාල් මාක්ස්, ලෙනින් සහ පැරණි සෝවියට් ලේඛනයන් ය. නමුත් මෙම මතවාදීමය උපරි ව්‍යුහයේ හෙජමොනිය ලබා ගැනීමේ සටනේදී දීප්ති විසින් යොදා ගත්තේ ඒ වන විට ඔහු විසින් අධ්‍යනය කරනු ලැබූ ෆර්ඩිනන්ඩ් ඩී සෝෂියර් ගේ භාෂා විද්‍යා මූලධර්මය තුළ පවතින සංඥාව, හැඟවුම සහ හැඟවුම්කාරකය, ආදී මූලධර්මත් ව්‍යුහවාදී චින්තකයින්ගේ න්‍යායන්, පශ්චාත් මාක්ස්වාදී චින්තකයින්ගේ න්‍යායන් සහ බටහිර දර්ශනනයි. ඒ තුළ දීප්ති විසින් හදාරනු ලැබූ ව්‍යුහවාදය සම්බන්ධ න්‍යායන් මෙන්ම ධනවාදය ලෝක ක්‍රමයක් ලෙස පැතිරෙත්ම බිහිවූ පශ්චාත් නූතන තත්වය සම්බන්ධයෙන් නව සංකල්ප ඇති කළ ජීන් බෝද්‍රිලා, ෆෙඩ්රික් ජෙමසන්, ජීන් පංශුවා ලියෝතා ආදීන්ගේ න්‍යායන් සම්බන්ධව කතිකාවක් ලාංකීය සමාජය තුළ ඇති කරනු ලැබීය. ඒ අනුව එතෙක් පැරණි වාමාංශිකයින්ට නොහැකිවූ නව ධනවාදය සම්බන්ධයෙන් විද්‍යාවක් ගොඩ නැඟීමට දීප්තිගේ ප්‍රයත්නය සාර්ථක විය. එහි ප්‍රතිඵලයක් ලෙස අප සංවිධානයේ සමාජිකයින්ව බාහිර සමාජය නාමකරණය කළේ පශ්චාත් නූතනවාදීන් ලෙසිනි.

කෙසේ වුවත්, දීප්ති විසින් ස්වාධීනව ඉහත පුවත්පත් සහ සඟරාවන්හි කටයුතු සිදු කරන අතර තුරදී හිරු පුවත්පතෙහි දීප්ති විසින් ලියන ලද 'කවුළුව හැර තිබේ' යන කොළම කියවන ලද රාගම පාඨකයන් පිරිසක් දීප්තිව ප්‍රථම වරට 94 වර්ෂයේදී දෙල්කඳ කාර්යාලයට පැමිණ මුණ ගැසුණි. ඔවුන් කතෝලිකයන් පිරිසක් වූ අතර, ඔවුන්ගේ අරමුණ වූයේ ඒ වන විට දීප්ති විසින් ලියූ ලිපි-ලේඛන සම්බන්ධයෙන් දීප්ති සමඟ දේශපාලන සංවාදයක් ඇරඹීමය. ඉන්පසුව දීප්තිගේ ප්‍රථම අධ්‍යනය කවය හිරු පාඨකයින් වෙත ආරම්භකරන ලදී. එය එවකට කොළඹ මහජන පුස්තකාලයේ කැන්ටිමේ පවත්වන ලදී.

ඉන්පසුව 1996 වර්ෂයේදී ගාමිණී විජේතුංග මාර්ගයෙන් රුවන් ෆර්ඩිනෙන්ඩ්ස් හඳුනාගෙන ඔහු විසින් සිදු කරන ලද ආරාධනයක් මත දීප්ති විසින් 1997 වර්ෂයේ සිට ගාමිණී විජේතුංග සමඟ සම කර්තෘත්වය දරමින් 'මාතොට' සඟරාව ඉදිරියට කර ගෙන

යන ලදී. 'මාතොට' තිඹිරිගස්සාය කාර්යාලයේ දීප්ති සමඟ ගාමිණී විජේතුංග, නිශාන්ත අල්විස්, සහ ජගත් පී පෙරේරා යන දීප්තිගේ පැරණි හිතවතුන් මාතොට සඟරාවේ සංස්කරණ කටයුතු කළෝය. දීප්ති විසින් ස්වාධීනව 'චින්තන අතිරේකය' නම් අතිරේකය තුළින් 'පශ්චාත් නූතනවාදය' සහ එහි හැසිරීම සම්බන්ධයෙන් සමාජ-දේශපාලන-ආර්ථික ලිපි ලිවීම ඇරඹුනි. ඉතාමත් සම්ප්‍රදායික භාෂා ලෝකයක සිටි පිරිසට දීප්ති විසින් ලාංකීය සමාජය විශ්ලේෂණය කරන නැවුම් සහ හරවත් ස්වරූපයත්, භාෂා විලාසයත්, ඔහුගේ දරුණු විචාරයත් හමුවේ සිවිල් චින්තකයින් සහ විශ්ව විද්‍යාල කතිකාචාර්යවරුන් මෙන්ම කලාකරුවන්ද බහුතරය විස්සෝපයට පත් විය. නමුත් දීප්තිගේ විචාරයන් හෝ න්‍යායික එළඹුම සම්බන්ධයෙන් ගැඹුරු අධ්‍යනයන් වල නොයෙදුණු පිරිස දීප්තිට ප්‍රසිද්ධියේ අභියෝග එල්ල කිරීමට මෙන්ම, දියුණු රටවල මෙන් බුද්ධිමය සංවාදයට ඒමට එකළ මැලිවිය. ඒ අනුව ක්‍රමානුකූලව දීප්ති විසින් ශ්‍රී ලාංකීය මතවාදී හෙජමොනිය අත්පත් කරගනිමින් සිටියේ ය. එම මතවාදයන් කෙතරම් ශක්ති සම්පන්නද යන්න වටහා ගත හැකි වන්නේ 1995 මෙරට ආරම්භකරන ලද රේඩියෝ-ටෙලිවිෂන් කලාව උඩු යටිකුරු කරමින් ඇරඹි මාධ්‍ය ජාලයේ ආධුනික නිවේදක නිවේදිකාවන් සඳහා වැඩමුළු කිහිපයක් පැවැත්වීම සඳහා සිරස මාධ්‍ය ජාලයේ ප්‍රධානියා වන නිමල් ලක්ෂපති ආරච්චි විසින් ආරාධනා කිරීමයි.

ඒ අතරතුර, ඊට සමගාමීව දීප්ති විසින් 'හිරු' පාඨකයින් සඳහා ගෙන ගිය දේශපාලන සංවාදය තව දුරටත් විධිමත් කරමින් එම සාකච්ඡාව විධිමත් අධ්‍යනකව පැවැත්වීම දක්වා සංවර්ධනය කරන ලද අතර, එම අධ්‍යනකව කොළඹ විශ්ව විද්‍යාලයේ ධම්ම දිසානායකගේ කාමරය තුළ සිට සිදු කිරීම අරඹන ලදී. එම අධ්‍යනකවය සඳහා හිරු පාඨකයින්, දීප්තිගේ සමීප මිතුරන්, මාතොට දීප්තිගේ පාඨකයින් මෙන්ම කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන් කිහිප දෙනෙකුද ද ඇතුළුව 35 දෙනෙකු පමණ අධ්‍යාපන කවයට සහභාගී විය. එහිදී දීප්තිගේ මතවාද සමඟ ඇඩිව අනන්‍යවුනු සිරස වැනි මාධ්‍ය ආයතන සහ පුවත්පත් වල මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමේදී පුද්ගලයෙක් ලෙස නොව කණ්ඩායමක් ලෙස හැඳින්වීමට දීප්ති කැමති විය. එම නිසාම ධම්මගේ යෝජනාවක් අනුව ඒ වන විට **'දේශපාලනයේ නව භාවිතාවක'** නියැලුණු දීප්තිගේ එම 'ක්‍රියාව' නාමකරණය කළ නොහැකි බැවින් X නම් අඥාත පදයෙන් හඳුන්වන ලදී. ඒ අනුව **'X කණ්ඩායම'** බිහිවිය.

ඉන්පසුව එතෙක් දීප්ති පමණක් ලියූ මාතොට සඟරාවේ ලේඛන කටයුතු සඳහා දීප්ති විසින් දැනුම ලබා දුන් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ටද අවස්ථාව ලබා දෙන ලදී. එහිදි එම ලේඛක පිරිස දීප්ති විසින් ලබා දුන් දැනුමට සමාගාමීව කණ්ඩායකමක් වශයෙන් මාතොට සඟරාවට ලිපි ලිවීම ඇරඹිනි. ඒ අතරතුර දීප්ති වෙත පැමිණි විවිධ තලවල පිරිස් වෙත දීප්ති විසින් අධ්‍යනකව කිහිපයක් අරඹා තිබුණි. 1995-2001 වන විට අප ව්‍යාපාරයට පැමිණි මෙන්ම පිටවුණු සිසුන්ගේ සංඛ්‍යාව ද ඉතා විශාල විය. එබැවින් අප ව්‍යාපාරය විසින් මහරගම, කළුබෝවිල, නාවල, සහ රත්මලාන පිරිවෙණ පාරේ සහ රත්මලාන සිරිමල් උයන යන ස්ථානවලින් නිවාස කුලියට ගෙන අප දේශපාලන ව්‍යාපාරයේ

දේශපාලන අධ්‍යනකව සහ අපගේ කෘතීන් සහ අනෙකුත් ලන්ඩන් ආදී ප්‍රකාශනවල කටයුතු සිදු කරන ලදී.

දීප්තිගේ අඛණ්ඩ හැදෑරීමේ ප්‍රතිපලයක් ලෙස 2001 වර්ෂය වන විට ශ්‍රී ලාංකීය **'මතවාදීමය හෙජමොනිය'** අප ව්‍යාපාරයට ලැබෙන අතර, අප ව්‍යාපාරය විසින් LONDON සඟරාව ඇරඹීමත්, හිස්ටීරියාව වැනි ග්‍රන්ථ ඇතුළු ග්‍රන්ථ කිහිපයක්ම ප්‍රකාශයට පත්කරන ලදී. 2001 ට පසුව අප සංවිධානය විසින් 'මනෝවිශ්ලේෂණය' විෂය ද අපගේ අනෙකුත් විෂයන් හා සමගාමීව අධ්‍යනය කරන්නට පෙළඹුණි. මෙම නව විෂය ඉගෙන ගැනීමට යාමේදී ඒ වන විට දීප්තිගේ දැනුම තුළින් මාතොට සහ ලන්ඩන් සඟරාවල ලිපි ලියූ දීප්තිගේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ඒ වන විට 'කණ්ඩායකමක්' වශයෙන් නොව 'පුද්ගලයින්' වශයෙන් ඉස්මතුවීමට සංවිධානය අභ්‍යන්තරයේම ප්‍රයත්න දරමින් සිටියහ. එම ඉස්මතු වීමට ඒ වන විට අප **'X කණ්ඩායමට'** ඒ වන විට සමාජය තුළ ලැබී තිබුණු **'සංකේතවටිනාකම'** තම තමන්ගේ **'පොරවල්'** වීමේ සිහිනයට අවභාවිතා කිරීමට එක් එක් අය විවිධ ආකාරයෙන් ක්‍රියා කරන්නට පෙළඹෙමින් තිබිණි. ඊට අමතරව සංවිධානය විශාල වෙත්ම එම සංවිධානයට පැමිණි සමාජික - සමාජිකාවන් අතර හොර රහසේ අරඹා තිබුණු මනෝ-ලිංගික සබඳතා වල විවිධ ගැටළු ද සංවිධානයේ ප්‍රධාන කාර්යයන් හි ගමන්මාර්ගය අඩාලකරවන්නක් විය. ඒ අනුව 2001 වසරේදී මතවාදි හෙජමොනිය තුළ ලැබූ **ජයග්‍රාහී හිස්තැන** තුළ අපගේ දේශපාලන වියාපාරයේ **සාර්වත්‍රික ගැටළුව** ප්‍රශ්න කරන මොහොත නැතිනම් **ධනවාදයට එරෙහි අරගලය** ස්ථාපිත කිරීම පවා පසුබැස්සේය. කෙසේ වුවද, ප්‍රභා මනුරත්න සහ බුද්ධික බණ්ඩාර ඇතුළු පිරිසක් 2004 සහ මහින්ද ප්‍රියදර්ශන ඇතුළු පිරිස 2014 වන විට අප සංවිධානයෙන් කණ්ඩායම් දෙකක් ලෙස ඉවත්ව යන අතර, දීප්ති සහ අප විසින් දිගින් දිගටම මේ දක්වා අප සමාජ ව්‍යාපරයේ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතින්නෙමු.

නවක ඔබ පැමිණෙන්නේ මෙම සියලු තත්ත්වයන් හමුවේ වසර 20 කට අධික කාලයක් විවිධ හැල හැපීම් වලට ලක්ව, විවිධ න්‍යායන් වර්ධනය කරමින්, මෙරට වාමාංශික දේශපාලන ව්‍යාපාරය **අධි නූතන සමාජව්‍යාපාරයක්** ලෙස විශාල ස්ථාපිත දැනුම්පද්ධතියකින් පිරිපුන් සමාජ ව්‍යාපාරයකටය.

2004 සිදුවීම වන තුරු, අපගේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ 'ආත්මීයත්වය (Subjectivity)' කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේ නැත. නමුත් 2004 වර්ෂයෙන් පසුව අප සංවිධානය විසින් විශාල ලෙස මිනිස් ආත්මීයත්වය මෙම සර්වත්‍රික ගැටළුව සමඟ ක්‍රියා කරන්නේ කෙසේද යන්නට විවිධ විද්‍යාවන් යටතේ න්‍යායික එළඹුම් වලට එළඹී තිබිණි.

සාමාන්‍යයන් වසර දහයෙන් දහයට ඉතිහාසය තුළ යම් යම් වෙනස්කම් සිදුවෙමින් පවතී යයි පැවසෙයි. දීප්ති විසින් දැඩි වෙහෙසක් දරා සකස් කරන ලද අපගේ විෂය නිර්දේශය තුළ පවතින විධිමත් භාවය විකෘති කිරීම් හෝ සොරාගත නොහැකි බව අප ව්‍යාපාරයේ පුස්තකාලයෙන් ග්‍රන්ථ කිහිලි අස්සේ හංගන් ගිය සොරුන්ට හෝ මෙම දැනුම ඉල්ලමක් බවට පත් කරගෙන ඕස්ට්‍රේලියානු ඔටුවන්ගෙන් ඩොලර් හිඟා කන හිඟන්නන්ට අදාළ නැති කාර්යයකි. ඔවුන්ට අපගේ දැනුම් සීමාවේ මායිමකට හෝ ඒමට නම් තව වසර ගණනාවක් කිසිදු බාහිර කාර්යයක් නොකොට බොහෝ පොත්පත් කියවිය යුතු වේ.

වසර ගණනාවකට පෙර අපෙන් ඉවත්ව ගිය විවිධ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අප ව්‍යාපාරයෙන් ඉවත්ව යන අවස්ථාවේදී ඔවුන් නොදැන සිටියේ අපගේ විධිමත් විෂය නිර්දේශයයි. ඔවුන් අධ්‍යාපන ක්‍රියාවලියේ අධ්‍යාපනයේ යම් ස්ථානයකට පැමිණීමට පෙර තම ආත්මීය උවමානවන්ගෙන් උමතුවෙන් අප සංවිධානයෙන් පිටව ගියෝ ය. එම පිරිසෙන් සුළු පිරිසක් සමාජයේ විවිධ ස්ථානවලදී අප දැනුම විකෘති කිරීම් සිදුකිරීමත් සහ අපගේ සමාජ ව්‍යාපාරයත්, අපගේ කාර්යයනුත් බැරෑරුම්ව බාර නොගෙන ඔවුන්ගේ ෆැන්ටසි ලෝක වල සැරි සරයි. උදාහරණයක් වශයෙන් විදර්ශන කන්නන්ගර වැන්නෙක් අපගේ දැනුම ගෙන සමාජය තුළ **ගම්මඩුවක්** නටනවා යයි අපට රූපිකව අර්ථ කතනය කළ හැකිය. මන්ද අප සංවිධානයේ අධ්‍යාපනය අර්ධ හැදෑරීමක් සිදු කර තමන්ගේ ආත්මීය ඊනියා නිදහස තකා සමාජගත වූ බොහෝ පිරිස මේ වන විට ආතුරයන්ව සමාජය තුල හැසිරෙයි. එම ආතුරයන් වෙත විදර්ශන වර්ගයේ ගම්මඩුවක් දැමීම කෙසේ හෝ සිදු විය යුතුය. මන්ද එය කපුවන්ට මෙන්ම ආතුරයන්ටද මද අස්වැසිල්ලක් වන බැවිනි.

කෙසේ වෙතත් ඔබ ඉහත ඉතිහාසය හා බද්ධ අපගේ විෂය නිර්දේශය පිළිවෙලකට ඉගන ගනිමින්, මෙම සාර්වත්‍රිකය වෙනුවෙන්, තම ආත්මීය මැදිහත්වීමට අවංක උවමනාවක් පවතින්නේද හෝ ඉහත ගම්මඩු, ශාන්තිකර්ම කපුවන්ගෙන් විකෘතියක් ලබා ගන්නේද යන්න පිළිබඳ තෝරා ගැනීම ඔබ සතුවේ. එම තෝරා ගැනීමට අනුව දීප්ති විසින් උගන්වනු ලබන විෂය නිර්දේශයේ තිබෙන සාරවත් භාවයත්, ගම්මඩු දේශකයන් විසින් සිදු කරනු ලබන ඉගැන්වීම් තුළ තිබෙන අසාරවත් භාවයත් අතර තිබෙන වෙනස අනාගත විද්‍යාර්ථීන් ඉදිරියේදී ඔප්පු කර පෙන්වනු ඇත.